**ශෙහාන් කරුණාතිලක** ගාල්ලේ ඉපදී කොළඹ හැදී වැඩී වෙළෙඳ දැන්වීම්, පුවත්පත්-සඟරා ලිපි, කතන්දර සහ සින්දු ලියයි. ඔහුගේ මුල්ම නවකතාව **චයිනමන්: ප්‍රදීප් මැතිව්ගේ ක්‍රිකට් ප්‍රවාදය** ඉන්දියාවේ, එක්සත් රාජධානියේ සහ අමෙරිකාවේ පළ වී මේ වනවිට, පොදු රාජ්‍ය මණ්ඩලීය සාහිත්‍ය සම්මානය, දකුණු ආසියානු කෘති සඳහා පිරිනැමෙන 2012 DSC ජයපූර් සාහිත්‍ය සම්මානය සහ 2008 ග්‍රේෂන් ත්‍යාගය දිනා ඇත. එය එක්සත් රාජධානියේ සුප්‍රකට වොටර්ස්ටෝන්ස් පොත්හලේ තේරීම අනුව 2011 වසරේ පිටවූ ජනප්‍රියම කුළුඳුල් නවකතා අතරින් එකකි. මේ දිනවල ඔහු සිය කුළුඳුල් දරුවාත් දෙවැනි නවකතාවත් සමග වෙහෙසෙන්නේය.

වැඩිපුර වෙළෙඳ දැන්වීම්ද ඉඳ හිට කවි, ගීත හා පුවත්පත්-සඟරා ලිපිද ලියන **දිලීප අබේසේකර** පොතකට යොමුවන පළමු අවස්ථාවයි මේ. ඔහු කොළඹ අශෝක, ආනන්ද විදුහල්වලින් හා ස්විට්සර්ලන්තයේ ජිනීවා නුවර, වෙබ්ස්ටර් සරසවියෙන් උගත්තෙකි. අමතකව ගිය වේදිකා නාට්‍යයකට, ටෙලි නාට්‍යයකට හා වැඩ නිම නැති චිත්‍රපට කිහිපයකටද ඔහු සම්බන්ධය.